# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 56 — 1973 අප්‍රේල් 19 වැනි බ්‍රහස්පතින්ද — 1973.04.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගයකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... | 365 |
| ජනාධිපතිතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 363 | මිළ පාලන දැන්වීම් ... | 368 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... | — |
| අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත්කිරීම් ආදිය ... | — | ආණ්ඩුවේ වක්කම් හා බැරයාම් ප්‍රකාශය ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... | 364 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... | 370 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | — | "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... | — |


සැළකිය යුතුයි.—(i) මෝටර් ගමනාගමන (සංශෝධන) පනත් කෙටුම්පත සහ මෝටර් වාහන (සංශෝධන) පනත් කෙටුම්පත 1973 අප්‍රේල් 11 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී, (ii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 15 දරණ ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනත 1973 අප්‍රේල් මස 19 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ වේ.

## ජනාධිපතිතුමාණන් කරන පත් කිරීම් ආදිය

### 1973 අංක 230

අංකය: ඩී/වීඑෆ්/36.

**යුද්ධ හමුදාව—ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

1968 දෙසැම්බර් මස 14 වැනි දින සිට කපිතාන් (උපකරණ පාලක) (කාර්මික) වරුන් වශයෙන්—

ලුතිනන් (උපකරණ පාලක) මගින් ඇනස්ලි රිචඩ් ද පොන්සේකා, ලංඉ.

ලුතිනන් (උපකරණ පාලක) දයානන්ද කගාර්ඉදියේ මානවඩු, ලංඉ.

ලුතිනන් (උපකරණ පාලක) කයිලාසපිල්ලයි මතියර්පිල්ලයි, ලංඉ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1972 දෙසැම්බර් 12 දින,
කොළඹ දීය.

4-438—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

### 1973 අංක 231 ... ...

අංකය: ඩී/වීඑෆ්/22 (ඒ).

**යුද්ධ හමුදාව—ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීමක් හා ඇතුළත් කිරීමක්**

1972 ජූලි මස 17 වෙනි දින සිට පහත නම සඳහන් බලයලත් නිලධාරියා, යුද්ධ හමුදාවේ ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාවේ ලුතිනන් (උපකරණ පාලක) (පොදු රාජකාරී) වශයෙන් අධිකාරියට පත් කිරීම සහ ඔහුව 2 (ස්වේච්ඡා) බලඇණිය, ලංකා සිංහ රෙජිමේන්තුවට ඇතුළත් කිරීම ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලදී.

19 තාවකාලික බලලත් නිලධාරී 1 දහම්සිරි නිස්සංක ද සිල්වා.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 මාර්තු මස 24 දින,
කොළඹ දී ය.

4-551—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු මස 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

# වෙනත් පත්කිරීම් ආදිය

**1973 අංක 232**

පා 4/2/13.
පා 4/2/16.
පා 4/1/32/72.
පා 4/1/2/2/72.
පා 4/1/2/18/73.
පා 4/1/3/29/73 (වා)
පා 4/1/5/11/73
පා 4/1/5/14/73
පා 4/1/5/14/73 (වා)
පා 4/1/7/28/73
පා 4/1/9/38/73
පා 4/1/9/43/72/(වා)
පා 4/1/9/49/73
පා 4/1/12/33/73/(වා)
පා 4/1/12/35/72(වා)
පා 4/1/14/58/73
පා 4/1/14/61/73
පා 4/1/15/57/72 (වා)
පා 4/1/25/94/72 (වා)
පා 4/1/32/113/73
පා 4/1/37/138/72 (වා)
පා 4/1/37/138/73 (වා)
පා 4/1/38/134/73

## අධිකරණ ආඥා පනත

(6 වන අධිකාරිය වූ) අධිකරණ ආඥා පනතෙහි 82 සහ 83 වන වගන්තිය යටතේ මා වෙත පැවරුනු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම,

(1) සමරප්පුලි ආරච්චිගේ පියසේන මහතා කුරුණෑගල දිස්ත්‍රික්කය තුල පිහිටි මාකඳුර ගම් ප්‍රදේශයේ සමගිදායකසින්ගේ සභාවේ සභාපති ධුරය දරන කාලය තුල කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(2) ඩී. බී. දසනායක මහතා අනුරාධපුර දිස්ත්‍රික්කය තුල පිහිටි කිරලව කෝරළේ නැගෙනහිර ගම් ප්‍රදේශයේ සමගිදායකසින්ගේ සභාවේ සභාපති ධුරය දරන කාලය තුල අනුරාධපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(3) වීරසිංහ ආරච්චිගේ හේමපාල මහතා අම්පාර දිස්ත්‍රික්කය තුල පිහිටි උඩ පළාත ගම් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ධුරය දරන කාලය තුල මඩකලපුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(4) මාතොට ගමරාලලාගේ ජයසේන මහතා අම්පාර දිස්ත්‍රික්කය තුල පිහිටි මැද පළාත ගම් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ධුරය දරන කාලය තුල මඩකලපුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(5) අතුරුගිරි ආරච්චිලාගේ ලුවිස් සිංඤෝ මහතා කුරුණෑගල දිස්ත්‍රික්කය තුල පිහිටි පොල්ගහවෙල සුළු නගර සභා ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ධුරය දරන කාලය තුල කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(6) හබීබු මොහමඩ් අසෙන් මොයිදීන් මහතා පුත්තලම හා හලාවත දිස්ත්‍රික්කයන් තුල පිහිටි කල්පිටිය ගම් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ධුරය දරන කාලය තුල පුත්තලම අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(7) මොහමඩ් ඉස්මායිල් මොහමඩ් හනීපා මහතා අම්පාර දිස්ත්‍රික්කය තුල පිහිටි පොතුවිල් ගම් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ධුරය දරණ කාලය තුල මඩකලපුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(8) ඒබ්‍රහම් ද අල්විස් මහතා ගාලු දිස්ත්‍රික්කය තුල පිහිටි බෙන්තොට සුළු නගර සභා ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ධුරය දරන කාලය තුල බලපිටිය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(9) ජී. බී. ඒකනායක මහතා ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ කොළඹ කාර්යාලයේ සහකාර කොමසාරිස් ධුරය දරන කාලය තුල කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(10) ජී. කරුණාරත්න මහතා ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ ගාල්ල ප්‍රාදේශීය කාර්යාලයේ සහකාර කොමසාරිස් ධුරය දරන කාලය තුල ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(11) මතීන් ද බුලන්කුලම මහතා අනුරාධපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර සහ නිල නොලත් මහෙස්ත්‍රාත් වරයෙකු වශයෙන් ද,

(12) ඕවන් ද මැල් මහතා අනුරාධපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර සහ නිල නොලත් මහෙස්ත්‍රාත් වරයෙකු වශයෙන් ද,

(13) සුලෙයිහා මාර්ලින් මහත්මිය කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරියක් වශයෙන් ද,

(14) එල්. එල්. රාජපක්ෂ මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(15) කේ. වී. සිරිල් මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(16) වෛද්‍යාචාර්ය ජයන්ත සෙනරත් කුලතිලක මහතා ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(17) ඩබ්ලිව්. ඒ. අමරසේන මහතා ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(18) එස්. ඒ. එමානිස් මහතා ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(19) ඩබ්ලිව්. ඕ. ප්‍රනාන්දු මහතා පානදුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(20) ඔමර් ලෙබ්බේ මුහමඩ් කාසිම් මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(21) ගමේ ගුරුන්නාන්සේලා ගෙදර නූහු ලෙබ්බේ සෙයිඩ් මොහමඩ් මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(22) රත්නතිලක මුදියන්සේලාගේ උක්කුබණ්ඩා රත්නතිලක මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(23) ජී. හීන්බණ්ඩා මහතා මාතලේ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(24) කේ. බී. දිසානායක මහතා මාතලේ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(25) ටී. ජී. ධර්මදාස මහතා මාතලේ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(26) එස්. එම්. පියදාස මහතා මාතලේ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(27) ඉහලගෙදර කිංගිරිබණ්ඩා මහතා මාතලේ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(28) ඇම්. ඇම්. පී. ගුණරත්න මහතා මාතලේ අධිකරණ දිස්ත්‍රික්කයේ සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(29) ඉඳුරුවේ මූල්ලෙ ආරච්චිගේ දොන් ප්‍රැන්සිස් ගුණසේකර මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(30) ඇම්. කේ. ඇඩ්වින් මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(31) වියුඩර් ඇපා සෙනෙවිරත්න මහතා බලපිටිය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(32) කන්දප්පන් කනපතිපිල්ලේ මහතා මඩකලපුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(33) මීරා ලෙබ්බේ මරික්කාර් මොහමඩ් ලෙබ්බේ මහතා මඩකලපුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(34) ජී. ඇස්. පී. පෙරේරා මහතා අනුරාධපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(35) යෝගමගේ චාර්ලිස් සිංඤෝ මහතා රත්නපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(36) බටදූව ආරච්චිලාගේ පියදාස මහතා අවිස්සාවේල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(37) සූරිය ආරච්චිගේ මහීපාල පෙරේරා මහතා රත්නපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(38) විතාරමලාගේ සුසිල් ප්‍රේමසිංහ මහතා රත්නපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(39) ප්‍රේමදාස විජේසේකර මහතා කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(40) කේ. ඇම්. පී. දාස්වත්ත මහත්මිය කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරියක් වශයෙන් ද,

පත් කරමි.

ෆී. ආර්. ඩී. බණ්ඩාරනායක,
අධිකරණ ඇමති.

1973 මාර්තු මස 30 වැනි දින,
කොළඹ 12.,
අධිකරණ අමාත්‍යාංශයේ දීය.

04–502—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

# ආණ්ඩුවේ නිවේදන

3/ආ/42.

### රජයේ ඉඩම් ආඥාපනත

රජයේ ඉඩම් ආඥාපනතේ ඡේදය 454 අංක 63 (1) දරන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමති, හෙක්ටර් කොබ්බෑකඩුව වන මම, මීට යා කොට ඇති උපලේඛනයේ නියමිත මුහුදු වෙරළ ප්‍රදේශය එයි හෝ එහි මතුපිටින් වැලි, ගල්, කොරල් හෝ වෙනත් ද්‍රව්‍ය ඉවත් නොකළ යුතු ප්‍රදේශයක් වශයෙන් මෙයින් නිවේදනය කර ප්‍රකාශ කර සිටිමි.

එච්. කොබ්බෑකඩුව,
කෘෂිකම් හා ඉඩම් ඇමති.

1973 අප්‍රේල් 4 වෙනි දින,
කොළඹ.

උපලේඛනය

එරාවූර් පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ පුන්නකුඩා වරායේ පුන්නකුඩාමුනේ සිට උතුරු දිගින් කොරලේ උතුරු ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ පතිච්චකර්නිකලපුව මුහුදට වැටෙන ලක්ෂ්‍යය දක්වා ඇති සම්පූර්ණ වෙරළ ප්‍රදේශය.

04–478—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

එල්.ඩී.—බී 154/33.

### තැපැල් කාර්යාල ආඥාපනත

(190 වැනි අධිකාරය වන) තැපල් කාර්යාල ආඥාපනතේ 8 වැනි වගන්තිය යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ රීතිය.

සී. කුමාරසූරියර්,
තැපැල් හා විදුලි සංදේශ අමාත්‍ය.

1973 අප්‍රේල් මස 6 දින,
කොළඹ දී ය.

රීතිය

1957 ජනවාරි 11 වැනි දින අංක 11,046 දරන ගැසට් පත්‍රයෙහි සහ 1959 ජූනි 12 වැනි දින අංක 11,771 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද රීතියෙන් සංශෝධිත 1934 නොවැම්බර් 30 වැනි දින අංක 8,093 දරන ගැසට් පත්‍රයේ අතිරේකයෙහි පළ කරන ලද 1934 දේශීය තැපැල් රීතිවල 85 වැනි රීතියේ අවසානයට පහත සඳහන් අතුරු විධානය අන්තර්ගත කිරීමෙන් එම රීති මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

" එසේ වුවද ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකු සම්බන්ධයෙන් වූ විට, ඔහුගේ නම හෝ අත්සන සහ ඔහුගේ නිල නාමය, ඔහු අත්සන් කිරීමට පුරුදුව සිටින භාෂාවෙන් ලියුම් කවරයෙහි හෝ කොපුවෙහි ලිවීම හෝ මුද්‍රා තැබීම කළ හැකිය. "

04–476—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

### දැන්වීමයි

1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය වානිජ නීතිගත සංස්ථා පනත

1970 අංක 33 දරණ ශ්‍රී ලංකා වානිජ නීතිගත සංස්ථා පනතේ වගන්ති 47 (1) යටතේ මෙහි සඳහන් දේපල සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදල් නිගමනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙමි.

1971. 8. 28 දින ශ්‍රී ලංකා රජයේ ගැසට් නිවේදන (අති විශෙෂ) අංක 14,973/2 යටතේ පැවරීමේ නියෝග අංක 2 මගින් ශ්‍රී ලංකා රාජ්‍ය වානිජ (සාමාන්‍ය) සංස්ථාව වෙත පවරනු ලැබූ දේපල සම්බන්ධයෙනි.

ඉහත සඳහන් පනතේ 47 (2) ට අනුව මෙකී ප්‍රසිද්ධ කරනලද දේපල සම්බන්ධයෙන් හිමිකම් ඇති සියල්ලන් වෙත වන්දි නිගමනයට පෙර ඔවුන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් ඉදිරිපත් වන බලයලත් නියෝජිතයකු මගින් හෝ ප්‍රසිද්ධකරන ලද දේපල වෙනුවෙන් වටිනාකම් පිළිබඳව මවිසින් වන්දි නිගමනය කිරීමට පෙර මා ඉදිරියේ සාක්ෂි ඉදිරිපත් කිරීමට අයිතියක් ඇති බව මෙයින් දැනුම් දෙමි.

එවැනි සාක්ෂි ඉදිරිපත් කිරීමට කැමති සියලු අය පුද්ගලිකව හෝ ඔවුන් විසින් බලය පවරනලද නියෝජිතයකු මගින් හෝ කොළඹ 6 සැවොයි ගොඩනැගිල්ලේ තුන්වෙනි මහලේ පිහිටි තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයට 1973 මැයි මස 5 දින පෙරවරු 9 ට පැමිණ එසේ කළ යුතුය.

එල්. ඕ. ද සිල්වා,
වැඩ බලන ප්‍රධාන තක්සේරුකරු.

තක්සේරු දෙපාර්තමේන්තුව,
සැවොයි ගොඩනැගිල්ල,
කොළඹ 6,
1973.4.7.

04–524—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

### කිරුම් හා මිණුම් ආඥාපනත යටතේ දැන්වීම

1971 අංක 7 දරණ කිරුම් හා මිණුම් සංශෝධන පනත මගින සංශෝධිත කිරුම් හා මිණුම් ආඥාපනතේ 2 (1) (සී) වගන්තිය යටතේ මිළ පාලන දෙපාර්තමේන්තුවේ සම්මත ප්‍රමාණ පරීක්ෂක ලෙස උපනන්ද සේනාරත්න මහතා 1973 මාර්තු මස 20 වැනි දින් සිට ක්‍රියාත්මකව දේශීය හා විදේශීය වෙළඳ ඇමතිතුමා විසින් පත් කර ඇත.

ජයන්ත කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1973 අප්‍රේල් මස 2 වැනි දින,
කොළඹ දී ය.

04–528—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

### ආඥා අංක 14.

**1970 අංක 14 දරණ මහවැලි සංවර්ධන මණ්ඩල පණතේ 27 වැනි වගන්තිය යටතේ ආඥාව**

1970 අංක 14 දරණ මහවැලි සංවර්ධන මණ්ඩල පණතේ 27 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග ඇමති, මෛත්‍රීපාල සේනානායක වන මම, මහවැලි සංවර්ධන මණ්ඩලයට අවශ්‍යවී ඇත්තාවූ පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇත්තාවූද ඉඩම් අත්කර ගැනීමේ යෝජනාව මෙම ආඥාව මගින් අනුමත කරමි.

මෛත්‍රීපාල සේනානායක,
වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග ඇමති.

යොමු අංකය : වාරි. වි., ම./ලේ : ඩබ්/එම්ඩී/එල්ඒ/2/73.
යොමු අංකය : ම. ස. ම—ඊඑන්ජී/පීඑල්/9 ඩී.
1973 අප්‍රේල් මස 10 දින,
කොළඹ දී ය.

### උපලේඛනය

ශ්‍රී ලංකා ජනරජයේ මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ වාරියපොල අංක 354 ග්‍රාමසේවක වසමට අයිති වාරියපොල-තිබ්බොටුමුල්ල ගමේ පිහිටි වාරියපොල ඉඩමෙහි කොටසක් ප්‍රමාණයෙන් අක්කර 1, රූඩ් 1, පර්චස් 30 පමණවූ ඉඩම් කැබැල්ලට මායිම් :—

වාරියපොල වත්ත—ප්‍රමාණයෙන් අ. 1, රූ. 1, පර්. 30 :—

උතුරට : එම ඉඩමේ කොටසක් ;

දකුණට : මහාමාර්ගය ;

නැගෙනහිරට : එම ඉඩමේ කොට්සක් ;

බස්නාහිරට : එම ඉඩමේ කොටසක්.

හිමිකම් කියන අය : වාරියපොල වතුයාය.

4–553—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

### මිල පාලන පනත

මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) විසින් පනවනු ලැබ, 1973.02.12 වැනි දින අංක 46/3 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1973 අංක 1 දරණ (සන්වජන්) මිල පාලන ආඥාව, විදේශීය හා දේශීය වෙළඳ ඇමතිවරයා විසින් 1973.03.30 වැනි දින අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතෙහි 4 (7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජයන්ත කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1973 මාර්තු මස 30 වැනි දින,
කොළඹ දීය.

4–301—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

### මිල පාලන පනත

මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) විසින් පනවනු ලැබ, 1973.03.06 වැනි දින අංක 49/5 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද 1973 අංක 1 දරණ (ආනයනය කරන ලද රෙදිපිළි) මිල පාලන ආඥාව, විදේශීය හා දේශීය වෙළඳ ඇමතිවරයා විසින් 1973.03.30 වැනි දින අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතෙහි 4 (7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජයන්ත කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1973 මාර්තු මස 30 වැනි දින,
කොළඹ දීය.

4–298—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

### 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

**49 වැනි ඡේදය යටතේ සහතිකය**

නිවාස සහ ගොඩනැගිලි ඇමති පීටර් ජෙරල්ඩ් බර්තොලමියුස් කෙනමන් වන මම 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වැනි ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම එම පනතේ 2 වැනි ඡේදයේ අදහසට ඇතුලත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම පිණිස රජය මගින් අත්පත් කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

පී. ජී. බී. කෙනමන්,
නිවාස සහ ගොඩනැගිලි ඇමති.

මහ 4/අත්/159
1973 මාර්තු 21,
කොළඹදීය.

#### උපලේඛන අංක 1

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ ගම්පල උඩ පළාත් ප්‍රා. ආ. නිලධාරි කොටසේ උනම්බුව 293/ඒ ග්‍රාම සේවක කොටසේ පිහිටි හුනුගල වත්ත නැමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් ඇති කොටස් 4 :—

(ඒ) උතුරට : හුණුගල වත්තේ ඉතිරි කොටස, උනම්බුවේ පන්සලට, එච්. එම්. හීන්බණ්ඩාට හා එච්. එම්. ඩිංගිරි බණ්ඩාට අයිති ඉඩම ;
නැගෙනහිරට : වත්තේ ඉතිරි කොටසට යන පාර ;
දකුණට : වත්තේ ඉතිරි කොටසට යන පාර හා ප්‍රසිද්ධ පාර ;
බටහිරට : එච්. එම්. ඩිංගිරිබණ්ඩාගේ, එච්. එම්. හීන්බණ්ඩාගේ ඉඩම් සහ උනම්බුව පන්සල වත්ත හා ප්‍රසිද්ධ පාර.

ප්‍රමාණය : අක්. 1, රූ. 2, පර්. 00

(බී) උතුරට : වත්තේ පාර හා හුණුගල වත්තේ ඉතිරි කොටස;
නැගෙනහිරට : එච්. එම්. ඩිංගිරිබණ්ඩාගේ, ඊ. බී. අලහකෝන්ගේ වතු ;
දකුණට : ගම්සභා පාර ;
බටහිරට : වත්තේ පාර හා ගම්සභා පාර.

ප්‍රමාණය : අක්. 2, රූ. 0, ප. 27

(සී) උතුරට : ගම්සභා පාර ;
නැගෙනහිරට : එච්. එම්. ඩිංගිරිබණ්ඩාගේ කුඹුර ;
දකුණට : ලියන්ගහදෙනිය වත්ත හා එච්. එම්. ඩිංගිරි බණ්ඩාගේ කුඹුර ;
බටහිරට : හුණුගල වත්තේ ඉතිරි කොටස ;

ප්‍රමාණය : අක්. 0, රූ. 1, ප. 00

#### උපලේඛන අංක 2

ඉහත උපලේඛන අංක 1 හි සඳහන් ඉඩම් වලට යාමඊම් සඳහා එම වත්තේ පාර සඳහා වෙන්කර ඇති ඉඩමෙන් පහත සඳහන් මායිම් ඇති ඉඩමේ පරවශතාවය :—

(ඩී) උතුරට : මෙම ඉඩමේ (හුණුගලවත්තේ) ඉතිරි කොටස ;
නැගෙනහිරට : මෙම ඉඩමේ (හුණුගලවත්තේ) ඉතිරි කොටස ;
දකුණට : මෙම ඉඩමේ (හුණුගලවත්තේ) ඉතිරි කොටස ;
බස්නාහිරට : මෙම ඉඩමේ (හුණුගලවත්තේ) ඉතිරි කොටස හා ප්‍රසිද්ධ පාර.

ප්‍රමාණය : අක්. 0, රූ. 2, ප. 13

4–521—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

**පඩිපාලක සභා ආඥාපනත**

**නිවේදනයයි**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 20(2)(ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව කම්කරු ඇමති මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, ගොඩනැගිලි කර්මාන්තයේ නියුක්ත කම්කරුවන්ට අදාළ මාසික ජීවන වියදම් අංකය නිශ්චය කිරීමට ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂවරයා නිසි නිලධාරියා වශයෙන් 1950 ජූනි මස 02 වැනි දින අංක 10,108 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද පත්කිරීම මෙයින් අවලංගු කරමි.

ඇම්. පී. ද ඉසඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 මාර්තු මස 30 වැනි දින,
කොළඹ දිය.

4–537—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

**පඩිපාලක සභා ආඥාපනත**

**නිවේදනයයි**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වන වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මීට යාව ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට, තේ පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව අදහස් කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරුද්ධතා වර්ෂ 1973 අප්‍රේල් මස 30 වැනි දින දවල් 12 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන සෑම විරුද්ධතාවයක්ම එසේ විරුද්ධවීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිත ලියවිල්ලකින් විය යුතුය.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
තේ පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ
පඩිපාලක සභාවේ සභාපති.

1973 අප්‍රේල් මස 10 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

තේ පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1945 ජූලි මස 21 වැනි දින අංක 9,436 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා කලින් කල වෙනස් කරන ලද්දවූ තීරණ එම උපලේඛනයෙහි III වන කොටසෙහි " ආණ්ඩුවේ නිවාඩු දවස් " යන ශීර්ෂය යටතේ ඇති (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, තවදුරටත් වෙනස් කළ යුතුය :—

" ආණ්ඩුවේ නිවාඩු දවස්

1. (අ) (1) මේ ඡේදයේ සහ 2 වන ඡේදයේ විධිවිධානවලට යටත්ව, සෑම සේවා යෝජකයකුම විසින් තමා යටතේ සේවයෙහි යොදවා සිටින්නා වූ සියලුම කම්කරුවන්ට 1971 අංක 29 දරණ නිවාඩු පනත යටතේ පහත සඳහන් ආණ්ඩුවේ නිවාඩු දවස් පඩි සහිත නිවාඩු දින වශයෙන් දිය යුතුය :—

(1) දෙමළ තෛපොන්ගල් දිනය ;

(2) සිංහල සහ දෙමළ අළුත් අවුරුදු දිනය ;

(3) මිලා-දුන්-නබි (මොහමඩ් නබිනායක තුමාණන් වහන්සේ උපන් දිනය) ;

(4) මැයි දිනය (මැයි 1) ;

(5) වෙසක් මස පුර පසළොස්වක් පොහෝ දිනයට ඉක්බිතිවම එළඹෙන දිනය ;

(6) ජනරජ දිනය (මැයි 22) ;

(7) නත්තල් දිනය. "

4–543/1—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

**පඩිපාලක සභා ආඥාපනත**

**නිවේදනයයි**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වන වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මීට යාව ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට රබර් පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව අදහස් කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරුද්ධතා වර්ෂ 1973 අප්‍රේල් මස 30 වැනි දින දවල් 12 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන සෑම විරුද්ධතාවයක්ම එසේ විරුධවීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිත ලියවිල්ලකින් විය යුතුය.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
රබර් පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ
පඩිපාලක සභාවේ සභාපති.

1973 අප්‍රේල් මස 10 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

රබර් පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1945 ජූලි මස 21 වැනි දින අංක 9,436 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා කලින් කල වෙනස් කරන ලද්දාවූ තීරණ, එම උපලේඛනයෙහි II වන කොටසෙහි "ආණ්ඩුවේ නිවාඩු දවස්" යන ශීර්ෂය යටතේ ඇති (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, තවදුරටත් වෙනස් කළ යුතුය :—

" ආණ්ඩුවේ නිවාඩු දවස්

1. (අ) (1) මේ ඡේදයේ සහ 2 වන ඡේදයේ විධිවිධානවලට යටත්ව, සෑම සේවා යෝජකයකුම විසින් තමා යටතේ සේවයෙහි යොදවා සිටින්නා වූ සියලුම කම්කරුවන්ට 1971 අංක 29 දරණ නිවාඩු පනත යටතේ පහත සඳහන් ආණ්ඩුවේ නිවාඩු දවස් පඩි සහිත නිවාඩු දින වශයෙන් දිය යුතුය :—

(1) දෙමළ තෛපොන්ගල් දිනය ;

(2) සිංහල සහ දෙමළ අළුත් අවුරුදු දිනට පෙරාතුව වූ දිනය ;

(3) සිංහල සහ දෙමළ අළුත් අවුරුදු දිනය ;

(4) මිලා-දුන්-නබි (මොහමඩ් නබිනායක තුමාණන් වහන්සේ උපන් දිනය) ;

(5) මැයි දිනය (මැයි 1) ;

(6) වෙසක් මස පුර පසළොස්වක් පොහෝ දිනයට ඉක්බිතිවම එළඹෙන දිනය ;

(7) ජනරජ දිනය (මැයි 22) ;

(8) බණ්ඩාරනායක අනුස්මරණ දිනය (සැප්තැම්බර් 26) ;

(9) නත්තල් දිනය. "

4–543/2—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

අංක සී/අයි. 1009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිතකර දක්වා ඇති කාරණය පිළිබඳව එක් පාර්ශ්වයක් වශයෙන්,

එක්සත් තෝ, රබර් සහ මෙරට ද්‍රව්‍ය කම්කරු සමිතිය, 71, මැලේ වීදිය, කොළඹ 2

සහ

අනික් පාර්ශ්වය වශයෙන්, 1. ද මහාරාජා ඕගනයිෂේෂන් ලිමිටඩ්, තැ. පෙ. 319, කොළඹ

2. ඒ. එෆ්. ජෝන්ස් (එක්ස්පෝටර්ස්) සිලෝන් ලිමිටඩ් තැ. පෙ. 261, කොළඹ

අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, නුගේගොඩ, පාගොඩ පාරේ අංක 18 හි ජේ. ජී. එල්. ස්වාරිස් මහතා වෙත මෙයින් යොමුකරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 අප්‍රේල් මස 03 දින,
කොළඹ දීය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

එක් පාර්ශ්වයක් වශයෙන්, එක්සත් තෝ, රබර් සහ මෙරට ද්‍රව්‍ය කම්කරු සමිතිය, 71, මැලේ වීදිය, කොළඹ 2,

සහ

අනිත් පාර්ශ්වය වශයෙන්, 1. මහාරාජා ඕගනයිෂේශන් ලිමිටඩ්, තැ. පෙ. 319, කොළඹ

2. ඒ. එෆ්. ජෝන්ස් (එක්ස්පෝටර්ස්) සිලෝන් ලිමිටඩ්, තැ. පෙ. 261, කොළඹ

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණු නම් පහත සඳහන් සේවකයින් නැවත සේවයෙහි යොදවන ලෙස ඒ. එෆ්. ජෝන්ස් (එක්ස්පෝටර්ස්) ලිමිටඩ් සහ මහාරාජා ඕගනයිෂේෂන් ලිමිටඩ් වෙතින් එක්සත් තෝ, රබර් සහ මෙරට ද්‍රව්‍ය කම්කරු සමිතිය කරන ඉල්ලීම යුක්ති සහගතද යන්නත් ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

1. ඩී. කේ. සෝමසිරි
2. අර්නස්ට් පෙරේරා
3. ඒ. රාමචන්ද්‍ර
4. ඒ. එස්. බාලක්‍රිෂ්ණන්
5. රාජා උපසේන
6. පෝල් කනකසුන්දරම්
7. එම්. ඩී. සිල්වා (මිය)
8. ඩී. එස්. ඩැනියල්
9. ලෙස්ලි සයිමන්
10. එල්. ඒ. කේ. ඩයස්
11. ආර්. දේවරාජා
12. ආර්. එල්. ඒ. අබේවර්ධන
13. ඒ. එම්. දයාරත්න
14. වින්සන්ට් ප්‍රනාන්දු
15. බී. එල්. එම්. ලයි
16. නිමල් ඩයස්
17. ඩබ්. සී. එම්. බොතේජු

1973 මාර්තු මස 20 වැනිද වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

4–520—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

# මිළ පාලන දැන්වීම්

## මිළ පාලන පනත

### ආඥාව

**අංක බීටී/1/73 දරණ ආහාර මිළ නියෝගය** **තිරිඟු පිටි**

(173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 3 (2) වගන්තිය සමඟ කියවිය යුතු 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මඩකලපු දිස්ත්‍රික්කයේ සහකාර මිළ පාලක තැන්පත් ජෝජ් කරුණාරත්න වන මම, මේ ආඥාවෙන් පහත සඳහන් නියෝගයන් නියම කරමි :—

(1) 1967 නොවැම්බර් 27 වැනි දින අංක 14,776/10 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පලකරන ලද 1967 නොවැම්බර් 25 වැනි දින බීටී/1/67 දරණ මිල ආඥාව මේ දැන් සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති 1 වැනි උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් මිළ ගණන් තිරිඟු පිටි තොග වෙළෙන්දන් විසින් තොග වශයෙන් විකිණීමේ ශුද්ධ බර රාත්තල් 148 එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මීට යාකර ඇති 2 වැනි උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් මිළ ගණන් තිරිඟු පිටි සිල්ලර වෙළෙන්දකු විසින් පාරිභෝගිකයකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක මිළ එම උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(4) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) තිරිඟු පිටි ශුද්ධ බර රාත්තල් 148 කට අඩු ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම, තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ආ) තිරිඟු පිටි ශුද්ධ බර රාත්තල් 148 කට අඩු ඕනෑම ප්‍රමාණයක් පාරිභෝගය සඳහා හෝ පාවිච්චිය පිණිස හෝ විකිණීම සිල්ලර විකිණීමක් ලෙස සලකන බවත්,

(ඇ) තිරිඟු පිටි සහ ඉරිඟු පිටි මිශ්‍ර කිරීම '' තිරිඟු '' ලෙස සලකන බවත්,

(5) තිරිඟු පිටි ඉරිඟු පිටි සමඟ හැර වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බවත් නියම කරමි.

(6) එසේම ඉරිඟු පිටි සියයට 10 කට වැඩි ප්‍රමාණයක් තිරිඟු පිටි සමග මිශ්‍ර කොට නොවිකිණිය හැකි බවද නියම කරමි.

(7) තිරිඟු පිටි විකුණන විට එය යම්කිසි දෙයක ඔතනු ලැබේනම් හෝ බහාලනු ලැබේනම් එහි මිළත් මෙම නියෝගයෙන් නියම කරනු ලබන වැඩිම මිළ ගණන්වලට අයත් වන බවද නියම කරමි.

(8) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක තිරිඟු පිටි සියස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දකුම එවැනි ද්‍රව්‍ය ප්‍රමාණයන් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍යය සඳහා මේ නියෝගයෙන් නියමිත වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සඳහන් කොට එම භාජනයට සම්බන්ධ කොට එකී ද්‍රව්‍ය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනු කාරයකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ හෝ තැබිය යුතු බව නියම කරමි.

(9) එසේම මෙම නියෝගයේ කාර්ය සඳහා '' රාත්තල '' හෙවත් '' රා.'' යනුවෙන් සලකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(10) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම තිරිඟු පිටි තොග වශයෙන් විකුණන හෝ තිරිඟු පිටි සිල්ලර වශයෙන් විකුණන හෝ සෑම වෙළෙන්දකු විසින්ම මිළයට ගන්නා ඉල්ලූවහොත්, එනම් :—

(අ) විකුණූ දිනය,

(ආ) විකුණූ තිරිඟු පිටි ප්‍රමාණය (බර අනුව),

(ඇ) විකුණූ තිරිඟු පිටි සඳහා ගෙවූ මුදල ; සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිලයට ගන්නාට දිය යුතු බවත් නියම කරමි.

1973 මාර්තු මස 22 වැනි දින පෙ.ව. 9.00ට මඩකලපු දිසාපති කාර්යාලයේ දී අත්සන් කරන ලදී.

ජෝජ් කරුණාරත්න,
සහකාර මිළ පාලක, මඩකලපු දිස්ත්‍රික්කය.

### පළමුවැනි උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>තොග වෙළෙන්දකු විසින් ශුද්ධ බර රාත්තල් 148ක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|
| මඩකලපුවේ මන්මුනේ උතුර සහකාර දිසාපති තැනගේ කොට්ඨාශය ... ... ... ... | 57 46 |
| මඩකලපුවේ එරාවූර් පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශය ... ... ... | 57 57 |
| මඩකලපුවේ කෝරළේ පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශය ... ... ... | 57 87 |
| මන්මුනේ දකුණ සහ එරුවිල් පෝරතිවු පත්තු සහකාර දිසාපති තැනගේ කොට්ඨාශය ... ... ... | 57 76 |
| මඩකලපුවේ මන්මුනේ බටහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශය ... ... ... | 57 72 |
| මන්මුනේ දකුණ සහ බටහිර සහ පෝරතිවු පත්තු ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශය ... ... ... | 57 76 |
| කෝරළේ පත්තු උතුර ප්‍රාදේශීය ආදායම් නිලධාරිතැනගේ කොට්ඨාශය ... ... ... ... | 57 87 |

### දෙවැනි උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දකු විසින් රාත්තලක් සිල්ලරට විකිණිය හැකි මිල<br>රු. ශ. |
|---|---|
| මඩකලපුව මන්මුනේ උතුර සහකාර දිසාපති තැනගේ කොට්ඨාශය ... ... ... ... | 0 40 |
| මඩකලපුවේ එරාවූර් පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශය ... ... ... | 0 40 |
| මඩකලපුවේ මන්මුනේ බටහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශය ... ... ... | 0 40 |
| මඩකලපුවේ කෝරළේ පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශය ... ... ... | 0 40½ |

සැලකිය යුතුයි.— (අ) මේ මිළ ගණන් තිරිඟු පිටි විකිණිය යුතු නියමිත මිළ නොවේ. ඒ මිළ ගණන් තිරිඟු පිටි විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. ඒවාට වඩා වැඩි මිළට තිරිඟු පිටි විකිණිය නොහැකිය.

(ආ) ශුද්ධ බර රාත්තල් 148 කට වැඩි හෝ අඩු හෝ මොනම ප්‍රමාණයක වුවත් තිරිඟු පිටි තොග වශයෙන් විකුණනු ලබන විට ඒ සඳහා වැඩිම මිළ ගණන් ගත යුතු වන්නේ ඉහත සඳහන් රාත්තල් 148 ක වැඩිම තොග මිළ වලට ප්‍රමාණයානුකූල වශයෙනි.

4-267/1—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

අංක බීට්/2/73 දරණ ආහාර මිළ ආඥාව — පාන්

### මිළ පාලන පනත

### ආඥාව

(173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 3 (2) වගන්තිය සමඟ කියවිය යුතු 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මඩකලපු දිස්ත්‍රික්කයේ සහකාර මිළ පාලක තැන්පත් ජෝජ් කරුණාරත්න වන මම මේ ආඥාවෙන් පහත සඳහන් නියෝගයන් නියම කරමි:—

(1) 1967 නොවැම්බර් 27 වැනි දින අංක 14,776/10 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරණ ලද 1967 නොවැම්බර් 25 වැනි දින අංක බීට්/2/67 දරණ මිල ආඥාව මේ දුන් සිට අවලංගු කරමි.

